# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2203/21 - 2020 නොවැම්බර් මස 25 වැනි බදාදා - 2020.11.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/B/2015/02.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමඟ කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.06.30 වැනි දින අංක 2182/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2020.03.13 වැනි දින දරන නියෝගයෙන්,

ආර්. පී. ආනන්ද සාගර මයා,
අංක 8/4 ඒ,
අන්නාසිවත්ත,
හල්ගම්පිටිය,
කළගෙඩිහේන.

සහ

ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
අංක 19, චෛත්‍ය පාර,
කොළඹ 01.

අතර පවත්නා 2019.12.30 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ඩී. එම්. කරුණාරත්න මයා වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළයුතු යැයි දුන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2020.03.13 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

නිමල් සිරිපාල ද සිල්වා,
කම්කරු අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

12 - 48/1


1A G 33274 - 40 (2020/11)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

මගේ අංකය: IR/COM/02/B/2015/02.

**ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

ආර්. පී. ආනන්ද සාගර මයා,
අංක 8/4 ඒ,
අන්නාසිවත්ත,
හල්ගම්පිටිය,
කළගෙඩිහේන.
සහ
ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
අංක 19, චෛත්‍ය පාර,
කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

හෝකන්දර උතුර,
අරංගල,
රණමයුර මාවත,
අංක 453/F,
වී. ජයරත්න මහතා පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/B/2015/02.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

ආර්. පී. ආනන්ද සාගර මයා,
අංක 8/4 ඒ,
අන්නාසිවත්ත,
හල්ගම්පිටිය,
කළගෙඩිහේන.
සහ
ශ්‍රී ලංකා වරාය අධිකාරිය,
අංක 19, චෛත්‍ය පාර,
කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

" ශ්‍රී ලංකා වරාය අධිකාරියේ ආරක්ෂක නියාමකවරයෙකු ලෙස 1987.02.10 දින සිට සේවය කරන ආර්. පී. ආනන්ද සාගර මහතා 2008.05.05 දින සේවා නිමා වී ඔහුට අයත් වාහනයෙන් තමා ඇතුළු 04 දෙනෙකු සේවා ස්ථානයෙන් පිටව යාමේ දී එම වාහනයේ අනවසර භාණ්ඩ තිබී සොයා ගැනීම සම්බන්ධයෙන් 01 අයෙකු ඉවත්කර 03 දෙනෙකුට පමණක් අභ්‍යන්තර විනය පරීක්ෂණයක් පවත්වා

දෙදෙනෙකුට නැවත සේවය ලබා දී පැමිණිලිකරු පමණක් සේවයෙන් ඉවත්කර ඇති අතර, එම සිද්ධියට ම අදාළව පැමිණිලිකරු ඇතුලු 03 දෙනෙකුට කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයේ පැවරූ නඩුවෙන් චූදිතයින් 03 දෙනාම නිදොස් කොට නිදහස් කිරීමෙන් පසුව හෝ පැමිණිලිකරුට පමණක් නැවත සේවය ලබාදීමට සේවායෝජක පාර්ශවය කටයුතු නොකිරීමෙන් පැමිණිලිකරුට අසාධාරණයක් සිදුව ඇද්ද යන්න සහ එසේ නම් ඔහුට හිමිවිය යුතු සහන කුමක්ද යන්න පිළිබඳව වේ.''

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ඔක්තෝබර් මස 13 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේදී දින යොදන ලදී.

12 - 48/2

---

මගේ අංකය: IR/COM/01/K/2015/61.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**
**4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම**

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමඟ කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරිය වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.06.14 වන දින අංක 2127/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2019.06.06 වැනි දින දරන නියෝගයෙන්,

චමිල් ප්‍රියන්ත සමරධීර මහතා,
අංක 13/2,
බටවල,
පාදුක්ක.

සහ

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
4 වන මහල,
''නිපුණතා පියස''
අංක 354/2, ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

අතර පවත්නා 2019.05.28 දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කාරණය පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් එච්. එම්. අනුලාවතී මෙනෙවිය වෙත යොමු කරන ලදී.

යථෝක්ත නියෝගය අවලංගු කළ යුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මා එම නියෝගය අවලංගු කරන අතර එකී 2019.06.06 දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙසද මෙයින් නියෝග කරමි.

නිමල් සිරිපාල ද සිල්වා,
කම්කරු අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

12 - 49/1

මගේ අංකය: IR/COM/01/K/2015/61.

**ලංකාවේ ව්‍යවසථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

චමිල් ප්‍රියන්ත සමරධීර මයා,
අංක 13/2,
බටවල,
පාදුක්ක.

සහ

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
4 වන මහල,
''නිපුණතා පියස''
අංක 354/2,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,
කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

මහනුවර,
ගුරුදෙනිය,
කැඳවල-මඩිත්ත,
අංක 286,
එච්. එම්. අනුලාවතී මෙනෙවිය පත් කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 ඔක්තෝබර් මස 20 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/01/K/2015/61.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරිය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

චමිල් ප්‍රියන්ත සමරධීර මයා,
අංක 13/2,
බටවල,
පාදුක්ක.

සහ

ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය,
4 වන මහල,
''නිපුණතා පියස''
අංක 354/2,
ඇල්විටිගල මාවත,
නාරාහේන්පිට,

කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණ වනුයේ,

'' ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ ජ්‍යෙෂ්ඨ වැඩසටහන් නිලධාරි වශයෙන් සේවය කරමින් සිටින චමිල් ප්‍රියන්ත සමරධීර මහතාට 2012.06.18 දිනැතිව ලබා දුන් පත්වීම් ලිපිය ප්‍රකාරව පුහුණු කළමනාකරු තනතුර (වර්තමානයේ සංශෝධනය කර ඇති සහකාර අධ්‍යක්ෂ) ලබා නොදී අදාළ වැටුප් තලයන්හි පිහිටුවා නොතිබීම තුළින් අසාධාරණයක් සිදුව තිබේ ද? එසේ අසාධාරණයක් සිදුව ඇත්නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද?'' යන්න පිළිබඳව වේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

12 - 49/2

---

මගේ අංකය: IR/COM/04/W/2015/144.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

කේ. පී. ප්‍රේමසිරි මයා,
අංක 279,
දෙව්රම් වෙහෙර,
තණමල්විල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

මත්තෙගොඩ,
මදා උයන,
අංක 149/102,
කේ. කේ. කුමාරි ධනපාල මිය පත් කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**නිමල් සිරිපාල ද සිල්වා,**
කම්කරු අමාත්‍ය.

2020 නොවැම්බර් මස 18 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/04/W/2015/144.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනතවල 131 අධිකාරිය වන**
**කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

කේ. පී. ප්‍රේමසිරි මයා,
අංක 279,
දෙව්රම් වෙහෙර,
තණමල්විල.

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට
හේතුවී පවත්නා කරුණ වනුයේ

'' ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ කතරගම ඩිපෝවේ රියදුරෙකු වශයෙන් සේවයේ යෙදී සිටි කේ. පී. ප්‍රේමසිරි මහතාගේ,

1. 2011.02.12 දින සිට විනය පරීක්ෂණයකින් තොරව සේවය නතර කිරීම.
2. සේවය නතර කළ 2011.02.12 දින සිට නැවත සේවය පිහිට වූ 2016.08.25 දින දක්වා කාලයට කිසිම සහනයක් ලබා නොදීම.

මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් කේ.පී. ප්‍රේමසිරි මහතාට හිමිවිය යුතු සහනයන් කවරේද යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ඔක්තෝබර් මස 26 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

12 - 50

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.